# අයවැය කාරක සභා අවස්ථාව - 2025
# සීමා නිර්ණය කොමිෂන් සභාව
# ප්‍රගති වාර්තාව
# (2024.01.01 – 2024.12.31)

**සීමා නිර්ණය කොමිෂන් සභාව - ප්‍රගති වාර්තාව**
**2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31දක්වා**

## 1.0 පසුබිම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(1) ව්‍යවස්ථාව අනුව, ගරු ජනාධිපතිතුමා විසින් 2023.05.19 දින, වසර තුනක කාලයක් සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාව පත් කරන ලදී. එහි සභාපති හා සාමාජික ලෙස ආචාර්ය කේ. තවලිංගම් මහතා ද සෙසු සාමාජිකයන් දෙදෙනා ලෙස ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය සහ එම්.අයි.අමීර් මහතා ද පත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථා වලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් කියැවේ. කෙසේ වුවද අනිකුත් කොමිෂන් සභා සම්බන්ධයෙන් මෙන් නොව මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ.

- කොමිෂන් සභාවේ කාර්යයන්
- කොමිෂන් සභාවේ බලතල

නව ආණ්ඩුක්ර්‍රම ව්යවස්ථාවක් සම්පාදනය කරන අවස්ථාවේදී හෝ ආණ්ඩුක්ර්‍රම ව්යවස්ථා සංශෝධනයක් කරන අවස්ථාවේදී සීමා නිර්ණය කොමිෂන් සභාවේ වගකීම්, කාර්යභාරය හා බලතල විස්තර කරන විට සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණය කිරීම න්‍යායානුගත කිරීමට කටයුතු කළ යුතුව ඇත. මේ සඳහා කොමිෂන් සභාව වෙත බලතල පැවරීමේ පනතක් සම්මත කළ යුතු අතර, එය දැනට, කෙටුම්පත් කර ඉදිරි කටයුතු සඳහා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

## 2.0 දැක්ම:- සාදාචාරාත්මක හා සාධාරණ මුලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය කරා ලඟා වීම

**මෙහෙවර-**:ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස හා සදාචාරාත්මක ලෙස, කාර්යක්ෂමවද, පාරදෘශ්‍යතාවයෙන් යුක්තවද, විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරීම.

**අරමුණු**

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරිම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරිම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරිමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරිම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදි අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දිම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

## 03. ක්‍රියාකාරකම්

**3.1 සීමා නිර්ණය කොමිෂන් සභාවේ රැස්වීම්:-** 2024.01.01 වන දින සිට 2024.12.31 දින දක්වා පරිපාලන හා ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් 12ක් පවත්වා ඇත.

10 වැනි රැස්වීම - 2024.01.10
11 වැනි රැස්වීම - 2024.02.12
12 වැනි රැස්වීම - 2024.03.14
13 වැනි රැස්වීම - 2024.04.17
14 වැනි රැස්වීම - 2024.05.14
15 වැනි රැස්වීම - 2024.06.19
16 වැනි රැස්වීම - 2024.07.17
17 වැනි රැස්වීම - 2024.08.20
18 වැනි රැස්වීම - 2024.09.25
19 වැනි රැස්වීම - 2024.10.23
20 වැනි රැස්වීම - 2024.11.22
21 වැනි රැස්වීම - 2024.12.16

### 3.2 සීමා නිර්ණය කාර්යය සම්බන්ධයෙන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව දැනුම්වත් කිරීම සඳහා කොමිෂන් සභා සාමාජිකයන් විසින් අත් පත්‍රිකා සකස් කිරීම.

සීමා නිර්ණය සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කිරීම සඳහා ප්‍රශ්ණෝත්තර සංග්‍රහයක් වශයෙන් භාෂාත්‍රයෙන්ම සකස් කල අත් පත්‍රිකාවක් ජනතාව වෙත ලබා දීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අවධානය යොමු වූ අතර, කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් එවැනි ප්‍රශ්ණෝත්තර සංග්‍රහයක් අත් පත්‍රිකා 02ක් වශයෙන් සකස් කරන ලදී. එම පළමු අත් පත්‍රිකාව මුද්‍රණය කර දීම සඳහා IRES සංවිධානය ඉදිරිපත් වූ අතර, PEFFRAL සංවිධානය ද ඒ සඳහා ඉදිරිපත් විය. නමුත් 2024 සැප්තැම්බර් මස පැවති ජනාධිපතිවරණ හේතුවෙන් එම කටයුතු කල් දැමීමට සිදු විය. ඉදිරියේ දී ඒවා මුද්‍රණය සඳහා එම ආයතන වල අනුග්‍රහය ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

### 3.3 මැතිවරණ නීති සංශෝධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම

මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත අප කොමිෂන් සභාව විසින් 2023.12.04 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර දීම සඳහා මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කැඳවීම මත 2024.06.04 දින එම කොමිෂන් සභාව වෙත සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් කරුණු දක්වන ලදී. එම කොමිෂන් සභා වාර්තාව මේ වන විට නිකුත් කර ඇත.

### 3.4 මැතිවරණ වලදී ස්ත්‍රී පුරුෂ සමාන ලෙස සැලකීමේ අවශ්‍යතාවය

මැතිවරණ වලදී ස්ත්‍රී පුරුෂ සමාන ලෙස සැලකීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් සිංහල හා ද්‍රවිඩ මාධ්‍යයෙන් ලිපියක් සකස් කර එය, මැතිවරණ කොමිෂන් සභාවේ වාර්ෂික පර්යේෂණ සැසිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව කොමිෂන් සභාව තීරණය කළ අතර, එය සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදී. නමුත් 2024 සැප්තැම්බර් මස පැවති ජනාධිපතිවරණය හේතුවෙන් එම පර්යේෂණ සැසිය කල් දමන ලද හෙයින් අදාල ලිපිය ඉදිරිපත් කිරීමට නොහැකි විය.

## 4. පරිපාලනමය කරුණු

### 4.1 .සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා කාර්යාල පහසුකම්

සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය කොළඹ 05, නාරාහේන්පිට, මිනින්දෝරු දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කොටසක කුලී ගෙවීමකින් තොරව පවත්වාගෙන යාමට මැනුම්පතිවරයා ඉඩ සලසා දී ඇත.

**වර්තමාන කාර්යාලයීය ලිපිනය**

සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ල
තැ.පෙ.506
කොළඹ 05

### 4.2 ප්‍රවාහන කටයුතු

සීමා නිර්ණය කොමිෂන් සභාවට 2016 වසරේදී අංක CAP 7180 දරන මෝටර් රථය හා අංක CAR 0347 දරන මෝටර් රථය ලබා දෙන ලද අතර, ඒම මෝටර් රථ දෙකම ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචි කර තිබුණි. එම මෝටර් රථ දෙකෙහි අයිතිය සීමා නිර්ණය කොමිෂන් සභාවේ ලේකම් නමින් 2024.05.28 දින පවරා දෙන ලදී. අංක CAP 7180 දරන මෝටර් රථය මෙම කොමිසමේ සභාපතිවරයා සඳහා වෙන් කර ඇති අතර, CAR 0347 දරන මෝටර් රථය කොමිෂන් සභාවේ සංචිතය වෙත අනුයුක්ත කර ඇත. මෙම වාහන සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් රාජකාරිමය ප්‍රවාහන කටයුතු සඳහා තවදුරටත් යොදාගනු ලැබේ.

### 4.3 සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්යභාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

| තනතුර | මට්ටම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෙෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරි | ජ්‍යෙෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | රා.පරි.ච. 6/2006 |
| පරිපාලන නිලධාරි | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතියික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතියික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

2024.12.31 දින වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

| තනතුර | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 [a] | - |
| ගණකාධිකාරි | 01 | 01 [a] | - |
| සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | 02 | 02 | - |
| එකතුව | 15 | 10 | 05 |

a -වැඩ බලන

- ලේකම් තනතුරෙහි වැඩ බැලීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අතිරේක සර්වේයර් ජනරාල් ( පාලන හා මානව සම්පත් ) අනුර මුතුමාල මහතා 2024.02.21 දින සිට 2025.02.21 දින දක්වා වසරක කාලයක් සඳහා හෝ දැනට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කර ගන්නා දිනය දක්වා හෝ යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් පත් කර ගන්නා ලදී.
- ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව නිත්‍ය තනතුරේ රාජකාරී වලට අමතරව, 2023.07.01 දින සිට වසරක කාලයක් සඳහා ධීවර අමාත්‍යාංශයේ ගණකාධිකාරී ෙලස රාජකාරී සිදු කළ ගණකාධිකාරී ඊ.ජී.එස්.සිසිර කුමාර මහතා පත් කර ගන්නා ලද අතර 2024.07.01 දින සිට 2025.06.30 දක්වා වසරක කාලයක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව, නැවත වරක් ඊ.ජී.එස්.සිසිර කුමාර මහතා ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා පත් කර ගන්නා ලදී.

## 5. මූල්‍යමය කරුණු

- විසර්ජන පනත අනුව, 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 18.16 ක් විය. ඉන් රුපියල් මිලියන 17.86 ක් පුනරාවර්තන වියදම් සඳහා සහ රුපියල් මිලියන 0.3 ක් ප්‍රාග්ධන වියදම් සඳහා විය.

- පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රුපියල් මිලියන 15.29 ක් දෙසැම්බර් මස අග වන විට වැය වූ අතර, ප්‍රාග්ධන වියදම් කිසිවක් සිදු වී නොමැත.